**<u>කැලණිය ප්‍රාදේශීය සභාව</u>**

**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කැලණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් ගිණුම් තැබීමට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම්ගත කලයුතු අවම වටිනාකමක් හා වත්කමේ ස්වභාවය හා ආයුකාලය අනුව එය ස්ථාවර වත්කමක් වශයෙන් හඳුනාගැනීමකින් තොරව ඉතා සුළු වටිනාකමක් හා නැවත විකුණා මුදල් කරගත නොහැකි කෙටි ආයුකාලයක් සහිත අයිතම ස්ථාවර වත්කම් ගිණුමට ඇතුලත් කර තිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සිංගර් මහන මැෂින් පහක (05) වටිනාකම තක්සේරුකර ගිණුමට ගෙන නොතිබුණි.

(ආ) කිරිබත්ගොඩ මූලික රෝහලේ හිඟ වරිපනම් බදු ශේෂය වූ රු.187,965 ක් හා තොරණ හන්දිය ඌරුමස් කඩයේ සාවද්‍ය හිඟ මුදල වූ රු.78,496 ක් 2017 දෙසැම්බර් 27 දිනැති තීරණ අංක 4436 න් කපාහැර තිබුණ ද එය අවසන් ගිණුමට ගලපා නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර ඇති වත්කම් 17 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) භෞතික පරීක්ෂාවට අනුව සභාවට අයත් වාහන අංගනයේ තිබුණු ට්‍රැක්ටර් රථ 03 ක්, ටේලර් රථයක් සහ ත්‍රීවීල් රථයක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.3 නොසැසඳුණු ගිණුම්

ගිණුම් විෂයයන් 05 ක මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් හා උපයෝගී ලේඛන හා වාර්තා අනුව ශේෂයන් අතර රු.410,572,192 ක වෙනසක් පැවතිණි.

#### 1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

**<u>ලැබියයුතු ගිණුම්</u>**

(අ) පෙර ගෙවුම් ලේඛනය අනුව 1995 සිට 2000 දක්වා රු.316,847 ක්, 2001 සිට 2005 දක්වා රු.5,451,644 ක් සහ 2006 සිට 2010 දක්වා රු. 2,296,570 ක් වශයෙන් රු.8,065,061 ක මුළු පෙර ගෙවුම් ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයට අදාල ව්‍යාපෘති රැඳවුම් මුදල් එකතු වටිනාකම රු.242,589 ක් කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් 2018 ජුනි 06 වන දිනටත් ලබාගෙන නොතිබුණි.

1.3.5 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

අවශ්‍ය උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.767,600 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 **<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | ----------------------------------------- | ----------- | --------------------- |
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | | සභා බල ප්‍රදේශයට අයත් සියළු මංමාවත් වල සැලැස්මවල් පිළියෙල කර නාම ලේඛනයක් ගැසට් පත්‍රයක් මගින් පලකර සභා අයිතියට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) | රු.47,292 | නිකුත්කර, ගෙවීම සඳහා ඉදිරිපත් නොකල මාස හය ඉකුත්වී ඇති චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 අගෝස්තු 24 දිනැති අංක 09/2015 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ මූල්‍ය චක්‍රලේඛය | | රාජ්‍ය ආයතන සතු අබලන්වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන මාස 03 ක් ඇතුලත අපහරණය කර අවසන් කළයුතු වුවද, ගිණුම් අනුව වටිනාකමක් හඳුනාගත නොහැකි සභාව සතු වසර ගණනාවක් පැරණි වාහන 02 ක් අපහරණය නොකර දිරාපත් වෙමින් පැවතුණි. |

1.3.7 **<u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>**

2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොගෙන, ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොකර හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන සභාවේ කාර්ය මණ්ඩලයට අයත් දරුවන් 153 දෙනෙකුට නැණ කිරණ ව්‍යාපෘතිය යටතේ රු.446,128 ක් වටිනා පාසල් උපකරණ කට්ටල් ලබා දී තිබුණි.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.68,430,011 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.66,267,217 ක් විය.

2.2 **<u>මූල්‍ය පාලනය</u>**

(අ) සභා අරමුදල් බල ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි සැලසුම් සහගතව වැය කිරීම සභාවේ අරමුණ හා පරමාර්ථය වුවද, සභාව සතු රු. මිලියන 11 ක මුදලක් මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු 02 ක අපේක්ෂිත සැලසුමකින් තොරව ආයෝජනය කර තිබුණි.

(ආ) ලංකා බැංකුවේ අංක 0000513466 දරන ජංගම ගිණුමේ 2014 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන රු.614,678 ක අගරු චෙක්පත් ශේෂයක් සහ හදුනා නොගත් රු.562,962 ක සෘජු බැර ශේෂයක් තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ මුදල | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ මුදල | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 53,550,000 | 54,958,058 | 62,275,053 | 25,212,920 | 63,600,000 | 72,347,775 | 79,632,073 | 32,529,916 |
| කුලී | 19,717,347 | 22,671,017 | 23,325,061 | 5,127,727 | 19,047,220 | 18,398,880 | 19,396,821 | 5,781,771 |
| බලපත්‍ර ගාස්තු | 1,552,500 | 1,829,128 | 1,829,128 | 359,566 | 2,202,500 | 1,764,596 | 1,764,596 | 359,556 |
| වෙනත් ආදායම් | 127,765,500 | 93,240,090 | 93,252,090 | - | 138,905,000 | 99,680,040 | 99,680,040 | - |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පූර්ව වර්ෂයේ රැස්කළ ආදායම රු.මිලියන 200.4 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු.මිලියන 180.6 දක්වා රු. මිලියන 19.8 කින් කැපී පෙනෙන ලෙස අඩුවී තිබුණි. මෙම අඩුවීමටප්‍රධාන වශයෙන් කර්මාන්ත බදු අඩුවීම, වෙනත් ආදායම් නියෝජනය වන මුද්දර ආදායම අඩුවීම හා සේවා සඳහා ගාස්තු ලැබීම්වල අඩුවීම බලපා තිබුණි.

### 2.3.3 වරිපනම් හා බදු

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු.25,778,228 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 5 සිට වසර 10 දක්වා රු.1,028,442 ක් හා වසර 1 ට අඩු රු.24,749,786 ක් ඇතුළත් වූ අතර, මෙම හිඟ මුදල් අයකර ගැනීමට සභාව විසින් නිසි පියවර ගෙන නොතිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයකින් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වූ හිඟ වරිපනම් බදු රු.767,028 ක මුදලින් 2018 ජනවාරි 03 දින රු. ලක්ෂයක් අයකරගෙන තිබුණද, ඉතිරි හිඟ ශේෂය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) පෞද්ගලික තානායමකින් 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වූ රු.261,414 ක හිඟ වරිපනම් ශේෂය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3.4 කුලී

(අ) කිරිබත්ගොඩ උතුරු මායිම කඩ කාමර සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ බදුකුලී මුදල රු.1,064,861 ක් වූ අතර මෙම හිඟ කඩ කාමර කුලී අයකර ගැනිමට නීතිමය පියවර ගැනීම සඳහා ලිඛිත ගිවිසුම් නොමැතිකම බාධාවක් වී තිබුණි.

(ආ) වර්ෂ 5-10 අතර වූ ඉඩම් හා ගොඩනැගිලි බදු කුලී හිඟ මුදල් රු.281,330 ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.5 <u>වෙනත් ආදායම්</u>

(අ) <u>පරිසර බලපත්‍ර</u>

(i) සභා බලප්‍රදේශයේ පවතින ලී මෝල්, යාන්ත්‍රික වඩු මඩු, නිවාඩු නිකේතන, ඉන්ධන පිරවුම්හල්, ඇඹරුම්හල්, මුද්‍රණාල, තෙල් මෝල් හා උත්සව ශාලා ඇතුළුව අනෙකුත් ව්‍යාපාර ආයතන අනිවාර්යයෙන්ම පරිසර බලපත්‍ර ලබා ගත යුතු වුවද, බල ප්‍රදේශයේ පිහිටි ආයතන 20 කින් පමණක් පරිසර බලපත්‍ර ලබා ගෙන තිබුණි. බල ප්‍රදේශය දියුණු ප්‍රදේශයක් බැවිනුත් කර්මාන්ත හා ව්‍යාපාර ඇතිවීමේ ප්‍රවනතාවයක් දැකිය හැකි ප්‍රදේශයක් බැවිනුත් ලබාගත් පරිසර බලපත්‍ර ප්‍රමාණය අවම මට්ටමක විය.

(ii) වලංගු කාලය ඉක්ම යාමට තුන් මසකට පළමුව බලපත්‍රය අළුත් කිරීම සඳහා ඉල්ලුම් කළ යුතු වුවද, 2017දෙසැම්බර් 31 දිනට කාලය අවසන් වන ආයතන තුනක් පරිසර බලපත්‍ර අළුත් කරවාගැනීමට 2018 ජුනි 06 දින වන විටත් ඉල්ලුම්පත් ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) <u>දැන්වීම් පුවරු ආදායම්</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්ති හා දෙසැම්බර් 28 දිනැති අංක 1947/6 2015 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 01 වන උප ලේඛනයේ අයකළ යුතු ගාස්තු ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ ඇති සියළුම දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකළයුතු වුවද, දැන්වීම් පුවරු 87 කින් පමණක් ගාස්තු අයකරගෙන තිබුණි.

(ඇ) <u>දූරකතන කුළුණු ආදායම</u>

(i) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුමත ලැයිස්තුව අනුව ස්ථාපිත කර ඇති සභා බල ප්‍රදේශයට අයත් දූරකථන කුළුණු සියල්ල හඳුනාගෙන 2009 අප්‍රේල් 17 දින අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ V වන උපලේඛනයේ V වන වගන්තිය ප්‍රකාරව ආදායම එකතුකර ගත යුතු වුවත්, කැලණිය සභා බල ප්‍රදේශය තුල කුළුණු 07 කින් පමණක් වාර්ෂික තක්සේරුව මත වරිපනම් ආදායම පමණක් එකතු කරගෙන තිබුණි.

(ii) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දූරකතන කුළුණු වලට සවිකරන ලද තරංග හුවමාරු උපකරණ අයත් ආයතන වලින් ව්‍යාපාර බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.97,073 ක කුළුණු ආදායමක් හිඟව පැවතුනි.

2.3.6 <u>මුද්දර ගාස්තු හා උසාවි දඩ</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. මිලියන 06 ක් හා මුද්දර ගාස්තු රු.මිලියන 108 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 51 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 48 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර තිබුණත් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්වූ ක්‍රියාකාරකම් 07 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) **අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම.**

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 10 ක් ඉටුකිරීම සඳහා රු. 2,485,000 ක මුදලක් වෙන්කරගෙන තිබුණද, එම මුදල් වැයකර 2017 දෙසැම්බර් 31 දින වන විට අපේක්ෂිත නිමවුම් මට්ටම් අත්පත්කරගෙන නොතිබුණි.

(ඈ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.**

(i) රු. මිලියන 27.98 ක් වැයකර ඉදිකරන ලද කැලණිය බස්නැවතුම්පොළෙහි පිහිටි කඩ කාමර 41 ක් 2011 වර්ෂයේ සිටම වසා දමා තිබූ අතර එම කඩ කාමරවලින් සභාවට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. එම භූමියේ හිමිකමද මෙතෙක් නිරවුල් කරගෙන නොතිබුණු අතර සභාව එම ගොඩනැගිල්ල සඳහා දැරූ පිරිවැය ද ගිණුම්වලින් ඉවත්කර තිබුණි.

(ii) හුණුපිටිය නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් 2011 වර්ෂයේ සිටම අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත්කර ගැනීමකින් තොරව පැවතුණි.

(ඉ) **අත්හැරදැමූ කර්තව්‍යයන්**

සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකළයුතු කර්තව්‍යයන් 04 ක් සඳහා රු.571,620 කට ගිවිසුම්ගතව තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැරදමා තිබුණි.

(ඊ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා බල ප්‍රදේශය තුල කසළ අපහරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය කිසිවක් දරා නොතිබුණු අතර අයභාර වැය වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 17 ක් වැයකර තිබුණි. එහෙත්,

(i) 2008 ජූලි 30 දිනැති අංක 1560/06 දරන ගැසට් පත්‍රයේ 18 (1) පරිදි වාර්ෂික අයවැය ලේඛනයේ කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා ගාස්තු නියමකර නොතිබුණි.

(ii) ඉහත සඳහන් ගැසට්පත්‍රය, 2011 ජූලි 05 දිනැති අංක 1713/11 දරන ගැසට් පත්‍රය හා 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව කසළ බදු හෝ ගාස්තු පනවා නොතිබුණි.

(iii) මානෙල්ගම කසළ අංගනයේ දිනකට ටොන් 09 ක් කොම්පෝස්ට් කරගැනීමට හැකියාව තිබුණ ද, නොදිරන කසළ ගබඩා කර තිබීම නිසා කොම්පෝස්ට් සකසන ප්‍රමාණය ටොන් 1 ½ දක්වා අවම වී තිබුණි.

(උ) **පාරිසරික ගැටළු**

බල ප්‍රදේශයේ කර්මාන්ත වලින් පරිසරයට සිදුවන හානි පිළිබඳව පැමිණිලි 05 ක් ඉදිරිපත්කර තිබුණු අතර ඒවා විසඳීමට සාධනීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. තොරණ හන්දිය, පොසොන්වත්ත පාර, ධීරානන්ද පිරිවෙන අසල, ගාල හන්දිය, සිලිකොන් ඉංජිනියර්ස් ආයතනය ඉදිරිපිට කුණු දැමීම සම්බන්ධව මහජන පැමිණිලි ඉදිරිපත්ව තිබූ අතර එම ගැටළු සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුකර තිබුණත් නිරාකරණය වී නොතිබුණි.

(ඌ) **තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 ජුනි 06 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

සභාවේ උත්සව ශාලාව බදු දීමෙන් බදුකරුගෙන් අයවිය යුතු මුදල රු.1,008,714 ක් වූ අතර 2018 ජුනි 06 දින වන විටත් නඩු තීන්දුවේ නියමයන් ක්‍රියාත්මක කරවාගෙන නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 02 | 02 | - | - |
| තෘතීයික | 01 | - | 01 | - |
| ද්විතීයික | 48 | 47 | 01 | 01 |
| ප්‍රාථමික | 207 | 194 | 13 | |
| අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් | | 28 | - | - |
| තාවකාලික පදනම මත | | 22 | - | - |
| | ---- | ----- | ------ | ------ |
| | 258 | 293 | 15 | 01 |

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුස්තකාලාධිපති තනතුරක්, ආදායම් පරීක්ෂක තනතුරක්, පෙර පාසල් ගුරු තනතුරක්, කාර්යාල කාර්ය සහායක තනතුරක්, මුරකරු තනතුරක්, පුස්තකාල සහායක තනතුරක්, ආදාහනාගාර ක්‍රියාකරු සහායක තනතුරක්, වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 05 ක් හා සෞඛ්‍ය කම්කරු තනතුරක් පුරප්පාඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තාක්ෂණ නිලධාරි තනතුරක් අතිරික්තව තිබුණි.

(ඇ) සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරියෙක් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ තනතුරක් සඳහා 2017 අප්‍රේල් 03 දින සිට වැටුප් රහිත නිවාඩු මත තාවකාලිකව මුදාහැර තිබුණි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**වරිපනම්/ දේපළ තක්සේරු කාලානුරූපීව සිදු නොකිරීම.**

1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත සහ 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් කළ යුතු විය.

එහෙත් සභාවට අයත් උපකාර්යාල තුනෙහිම වරිපනම් දේපල 2008 වර්ෂයේ තක්සේරු කර වර්ෂ 9 ක් පමණ ගතවී තිබූ නමුත් දේපළවල වර්තමාන අගය පදනම්කරගෙන තක්සේරු ප්‍රතිශෝධනයක් සිදුකර ගැනීමට සභාවඅපොහොසත්වීම නිසා සභා බලප්‍රදේශයේ දේපල ඒකක 43951 කින් අයකළහැකි යාවත්කාලීන වූ බදු ප්‍රමාණය අයකරගත නොහැකිවී තිබුණි.

3.5 **වත්කම් කළමනාකරණය**

3.5.1 **වත්කම් ලේඛනගත නොකිරීම.**

(අ) මූලා‍ය ප්‍රකාශනවලට කසළ කරත්ත / අත් කරත්ත 48 ක් ඇතුලත්කර තිබුණද, භෞතික වත්කම් පරීක්ෂාවේදී කසළ කරත්ත / අත් කරත්ත 17 ක් පමණක් තිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් ඉඩම් හා ගොඩනැගිලි යටතේ වූ වත්කම් 07 ක් හා වාහන 02 ක් ස්ථාවර වත්කම් ලේඛනවල සටහන් කර නොතිබුණි.

3.5.2 **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම.**

සභාවට අයත් දේපළක් ලෙස නාමපුවරු ප්‍රදර්ශනය නොකිරීම, සභාවට අයත් ළිං අනවසරයෙන් ගොඩකර සිය ඉඩම්වලට අල්ලාගෙන ඇති පාර්ශවවලට විරුද්ධව කටයුතු නොකිරීම, මායිම් ලකුණු කර කම්බි ගසා දේපළ වෙන්කර හඳුනාගත හැකි පරිදි සකස්කර නොතිබීම වැනි ක්‍රියාවන් නිසා වත්කම්වල ආරක්ෂාව තහවුරු වී නොතිබුණි.

3.5.3 **නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම.**

(අ) වාහන අංගනය තුල හා ප්‍රධාන කාර්යාල භූමියේ දිරාපත් වෙමින් දීර්ඝ කාලයක සිට තිබෙන ට්‍රැක්ටර් 03 ක් හා ත්‍රීරෝද රථයක් සුදුසු පරිදි අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) කිරිබත්ගොඩ සමූපකාර නිවාස ක්‍රමයේ පිහිටි පොදු ළිඳ, හුණුපිටිය කාන්ති මාවතේ ළිඳ ඇතුළුව ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ ඇති ළිං ප්‍රතිසංස්කරණය කර නොතිබුණි.

3.5.4 **පවරා නොගත් වත්කම්**

මූලා‍ය ප්‍රකාශනවල සටහන් වූ දේපල 112 කින් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවලට අදාලව මිණුම්කර ඔප්පු හෝ පැවරුම් නියෝග ලබාගෙන නොතිබූ හා දේපළෙහි අයිතිය නිරවුල් කරගෙන ඔප්පු සකස්කරගෙන නොමැති දේපළ සංඛ්‍යාව 52 ක් විය.

3.5.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) 2016 නොවැම්බර් 11 දින පරිත්‍යාග ලෙස ලැබුණු රු. මිලියන 32 ක් වටිනා බාච් යන්ත්‍රය එදින සිට උපයෝජනයකින් තොරව නිශ්ක්‍රියව තිබුණි.

(ආ) පළාත් පාලන අමාත්‍යාංශය මගින් 2014 නොවැම්බර් 16 දින ලබාදී තිබූ ගැල්වනයිස් බට 423 ක් 2017 ජූනි 06 වන විටත් ඌන උපයෝජන මට්ටමේ තිබුණි.

3.6 **ප්‍රසම්පාදනය**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන ඒජන්සි චක්‍රලේඛ අංක 8 හි 4.2.1 (b) සහ (c) පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තර සහිතව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

4. **<u>යහපාලනය හා ගිණුම් කටයුතු භාවය</u>**

**<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් කර්තව්‍යයන් 19 ක් සඳහා ඇති කළ රු.2,872,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

5. **<u>පද්ධති හා පාලනය</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **<u>පද්ධතිය</u>** | | **<u>අඩුපාඩුව</u>** |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | යාවත්කාලීනව දේපළ තක්සේරු නොකිරීම. |
| | | (ii) | හිඟ ආදායම් එකතු කිරීම දුර්වල තත්ත්වයක පැවතීම. |
| | | (iii) | නව ආදායම් ප්‍රභවයන් හඳුනාගෙන ආදායම් රැස්නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | (i) | වැය විෂයන් සඳහා වෙන්කළ මූල්‍ය ප්‍රතිපාදනයම භාවිතා නොකිරීම. |
| | | (ii) | අධි වෙන් කිරීම් තිබීම. |
| | | (iii) | ප්‍රතිපාදන ඌන උපයෝජනය |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | හිමිකම් ඔප්පු ලබා නොගැනීම. |
| | | (ii) | වත්කම් පිළිබඳ ලේඛන පවත්වා නොගැනීම. |
| | | (iii) | පිරිවැය තොරතුරු රහිත ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත නොකිරීම. |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසළ එකතු කිරීම, බැහැර කිරීම හා කොම්පෝස්ට් පොහොර සකස් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් නොකිරීම. |
| | | (ii) | කසළ බැහැරකිරීම සඳහා වැය වන අධික පිරිවැය පාලනය නොකිරීම. |